# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023**
**2025 අගෝස්තු / සැප්තැම්බර්**

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ සංස්කෘතිය
**(නව නිර්දේශය)**

**ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය හා සාහිත්‍ය විචාරය BUCU – 18224**

කොටස් දෙකෙන්ම ඇතුළත් වන සේ
ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## <u>I කොටස</u>

01. බුදුසමය අනුදක්නා ගිහි විනය අධ්‍යයනය කිරීමේ මූලාශ්‍රයක් ලෙස දීඝනිකායේ සිගාලෝවාද සූත්‍රයේ උපයෝගිතාව විමර්ශනය කරන්න.

02. බුදුසිරිතෙන් ප්‍රකට වන නායකත්වය පිළිබඳ පරමාදර්ශය මහාපරිනිබ්බාණ සූත්‍රය ඇසුරින් තහවුරු කරන්න.

03. සෞන්දර්යය හා රසාස්වාදය පිළිබඳ බෞද්ධ ස්ථාවරය තහවුරු කිරීමෙහි ලා සක්කපඤ්හ සූත්‍රාගත වෘත්තාන්තය කෙතෙක් දුරට ඉවහල් කරගත හැකි දැයි සකාරණව පහදන්න.

04. ආදිතම යුගයේ ශාසන ඉතිහාසය අධ්‍යයනය කිරීමේ ප්‍රාථමික මූලාශ්‍රයක් ලෙස මහාවග්ගපාළියේ මහාඛන්ධකයේ අන්තර්ගතය කෙතෙක්දුරට ඉවහල් කරගත හැකි දැයි විමසන්න.

05. භික්ෂු විනය අරමුණු කරගත් සේඛියා ශික්ෂාවන්හි සමාජ උපයෝගිතාව සකාරණව පහදන්න.

## <u>II කොටස</u>

06. බුදුදහමේ හා සාහිත්‍ය නිර්මාණයන්හි සාපේක්ෂක උපයෝගිතාව එම ක්ෂේත්‍ර දෙකෙහි ම සංවර්ධනය පිණිස ඉවහල් වූ අයුරු සාකච්ඡා කරන්න.

07. බොදුනු ජනමන තුළ බුදුසිරිත පිළිබඳ පහන් සංවේගාත්මක ආකල්ප ජනිත කිරීමෙහි ලා බුත්සරණ කතුවරයා සතුව පැවැති වර්ණනා චාතුර්යය අගය කරන්න.

08. බෝසත් සිරිත අරමුණු කරගත් ජාතක කතා මෙරට ජනජීවිතය කෙරෙහි ඇති කළ බලපෑම කෙතෙක් දැයි විභාග කරන්න.

09. උභයාර්ථ සාධනයෙහි ලා ඉවහල් කරගත හැකි සදුපදේශ ඇතුළත් කෘතියක් ලෙස ඇගයෙන සද්ධර්මරත්නාවලියට ප්‍රස්තාවනාවක් සපයන්න.

10. සිංහල නාට්‍ය කලාවේ ප්‍රවර්ධනය විෂයෙහි බෞද්ධ සංස්කෘතිය කෙතෙක් දුරට බලපා ඇද්දැයි සනිදර්ශනව පැහැදිලි කරන්න.

*************************